Library copy

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Article 12(1). **HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date 2019-06-04

පැමිණිලිකරුවන් : 01. පී.ඒ. විජයානි වික්‍රමසිංහ මිය,
ගල්ගමුව උතුර,
මහරච්චිමුල්ල.

02. පී.එම්.එස්. විජේරත්න මිය,
184/12, පුත්තලම් පාර,
කුරුණෑගල.

03. එච්.එම්.ඊ.ඩී. හේරත් මිය,
49/2, දෙමටගොල්ල වත්ත,
දෙල්ගොල්ල, පොල්ගහවෙල.

04. ඒ.එම්.ඩී.කේ. අතපත්තු මිය,
171, කම්බි කණුව,
ලිහිණිගිරිය, පොතුහැර.

05. ඒ.බී.ටී.එම්.වී.ජේ. බණ්ඩාරනායක මිය,
නො. 490, සුන්දරාපොල පාර,
යන්නම්පලාව.

වගඋත්තරකරුවන් : 01. ලේකම්, - NWP/CM/AD6/9/1
වයඹ ප්‍රධාන අමාත්‍යාංශය,
1 වන මහළ, පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
විද්‍යුත් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 / 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

02. වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, - ව/අධ්‍යා/විම/මා.හි/පොදු
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
කුරුණෑගල.

03. පී.එම්. නසීර් මයා,
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක (පරිපාලන)
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
කුරුණෑගල.

04. විදුහල්පති,
කු/ශුද්ධවූ පවුලේ බාලිකා විද්‍යාලය,
කුරුණෑගල.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/K/64/18 - A</u>**

පැමිණිල්ල -

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමන්ගේ දරුවන් 2018 වර්ෂයේ කුරුණෑගල ශුද්ධවූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ පළමු වන වසරට "පාසලේ ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වන මව්පියන්ගේ දරුවන්" ගණය යටතේ ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්කර සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටින ලද බවත්, නමුත් සම්මුඛ පරීක්ෂණය සඳහා එවන ලද කැඳවීම් ලිපියත් සමඟ එවන ලද ලකුණු ලබාදීමේ ආකෘතිය වෙනුවට එම අවස්ථාවේදී ආදිශිෂ්‍ය සංගමයේ ඉල්ලීම මත සකස්කරන ලද නව අකෘති පත්‍රයක් භාවිතා කරන ලද බවත්, එසේ වුවද එවන් තීරණයක් ගැනීමට ආදිශිෂ්‍ය සංගමයේ මහසභා රැස්වීමක් හෝ පවත්වා සාමාජිකාවන් වන තමන්ව දැනුවත්කර නොමැති බවත් සඳහන් කර ඇත. උක්ත ආකෘතිපත්‍රය මගින් ආදිශිෂ්‍යාවන් වන තමන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ සඳහා ලකුණු කප්පාදු කර ක්‍රීඩා කටයුතු සඳහා වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාදීමෙන් සිදුකර ඇත්තේ පාසලින් ලබාගත් අධ්‍යාපන ජයග්‍රහණ හෑල්ලුවට ලක් කිරීමක් බවද සඳහන් කර ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ආදිශිෂ්‍යාවන් වන තමන්හට සිදුකරනු ලැබූ අසාධාරණය සම්බන්ධයෙන් පැමිණිල්ලක් 2017.10.30 දින වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත කිරීමෙන් පසු 2018.01.03 දින ලේකම්වරයාගේ කාර්යාලයේදී පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තමන් සමඟ සාකච්ඡාවක් සිදුකලද තමන්ගේ ගැටලුවට කිසිදු සාධාරණ විසඳුමක් ලැබී නොමැති බැවින් කොමිෂන් සභාව මගින් සාධාරණයක් ඉටුකර දෙන ලෙසට මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාළව හතරවන වගඋත්තර පාර්ශවය වන කුරුණෑගල ශුද්ධවූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ විදුහල්පතිනියගෙන් වාර්තාවක් ඉල්ලා ඇතත් වාර්තාවක් ඉදිරිපත් කර නොමැති අතර 2018.03.20 වන දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණය සඳහා තෙවන වගඋත්තර පාර්ශවීය වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක (පරිපාලන) පී.එම්. නසීර් මහතා හා කුරුණෑගල ශුද්ධවූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ විදුහල්පති සහභාගි වෙමින් කරුණු දක්වා ඇත.

වගඋත්තර පාර්ශවය පෙන්වා දී ඇත්තේ, වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත්කර ඇති සංශෝධන අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස පරිපාලන සේවයේ නිලධාරියෙකු පත්කිරීම නීත්‍යානුකූල බවත් අදාළ සම්මුඛ පරීක්ෂණයේදී ලබාදී ඇති ආකෘති පත්‍රය මඟින් පැමිණිලි පාර්ශවයට කිසිදු අසාධාරණයක් සිදු නොවන බවත් එමගින් පැමිණිලි පාර්ශවයට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගැනීමට අවස්ථාවක් තිබූ බවත් අදාළ ආකෘති පත්‍රය වෙනස් කිරීම පිළිබඳ පැමිණිලි පාර්ශවය පළාත් අධ්‍යාපන ලේකම් වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණයක් පවත්වන ලද බවත් අදාළ පරීක්ෂණය අනුව පැමිණිලි පාර්ශවයට අසාධාරණයක් සිදුවී නොමැති බවට එම පරීක්ෂණ කමිටුව විසින් තීරණය කර ඇති බවත්ය.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලි පාර්ශවය සිය දරුවන් කුරුණෑගල ශුද්ධවූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ 2018 වර්ෂයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා ආදිශිෂ්‍ය ගණය යටතේ අයදුම්කර සම්මුඛ පරීක්ෂණයට පෙනිසිටි අයවලුන් වේ.

රජයේ පාසල්වල පළමුවන වසරට දරුවන් ඇතුලත් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති අංක 22/2017 දරණ චක්‍රලේඛය අනුව පැමිණිලිකරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේදී ලකුණු ලබා දෙන ආකාරය ඇතුළත් ආකෘති පත්‍රයද පැමිණිලිකරුවන් වෙත යවන ලද කැඳවීම් ලිපිය සමඟ ලබා දී ඇත.

එහෙත් පැමිණිලි පාර්ශවය සම්මුඛ පරීක්ෂණයට පෙනිසිටින අවස්ථාවේදී වෙනත් ආකෘතිපත්‍රයක් ලබාදීම මඟින් මුල් ආකෘතිපත්‍රය අනුව ලබාගැනීමට තිබූ සමහර ලකුණු දෙවන ආකෘතිපත්‍රය අනුව අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

අංක 22/2017 චක්‍රලේඛනයෙහි 7.3.2 හි iv අනු කොටස යටතේ මුල් ආකෘතිපත්‍රයට අනුව දහම් පාසල් සහතිකය (විශිෂ්ය) සඳහා ලකුණු 3 ක් ලබා ගැනීමට අවස්ථාව තිබී ඇති නමුත් 2 වන වරට ලබා දී ඇති ආකෘතිපත්‍රය අනුව ඒ සඳහා ලකුණු 1 ක් පමණක් ලබාදීම සිදුකර ඇති බවට නිරීක්ෂණය වේ.

22/2017 චක්‍රලේඛනයෙහි 7.3.3 යටතේ පාසැල් කාලය තුළ අයදුම්කරු විසින් විෂය සමගාමී කටයුතුවලින් ලබා ගත් ජයග්‍රහණ යටතේ ලබාදෙනු ලබන ලකුණු 15 ක්‍රීඩා, විෂය සමගාමී හා සෞන්දර්ය යන අනු කොටස් යටතේ ලකුණු ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමිකර දෙවන වරට ලබා දී ඇති ආකෘතිය මගින් අදාළ ලකුණු 15 ක්‍රීඩා විෂයට පමණක් සීමාකිරීම මගින් ක්‍රීඩා මගින් ලකුණු ලබාගත නොහැකි අයවලුන් හට විෂය සමගාමී හා සෞන්දර්ය යටතේ ලකුණු ලබාගැනීමට ඇති අවස්ථාව අහිමිකර ඇතිබව නිරීක්ෂණය වේ.

22/2017 චක්‍රලේඛනයෙහි 7.3.4 යටතේ ආදිශිෂ්‍ය සංගම් සාමාජිකත්වය, පාසැල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපන ජයග්‍රහන හා පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධාකාරයේ සහයෝග යටතේ මුල් ආකෘතියේ යාවජීව සාමාජිකත්වය සඳහා ලබා දී ඇති ලකුණු 3 දෙවන වරට ලබාදී ඇති ආකෘති පත්‍රයෙන් ඉවත් කිරීම තුලින් අදාළ ලකුණු 3 ලබා ගැනීමට පැමිණිලි පාර්ශවයට අවස්ථාව අහිමි වී ඇති බවද නිරීක්ෂණය වේ.

තවද එම චක්‍රලේඛනයෙහි 7.3.4. හි iv අනු කොටස යටතේ මුලින් ලබාදී ඇති ආකෘතියෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ලකුණු 2 ක් වෙන්කර ඇති නමුත් දෙවනවර ලබාදී ඇති ආකෘතිපත්‍රයෙහි ඒ සඳහා ලකුණු 1 ක් පමණක් ලබාදීම මගින් අයදුම්කරුවන් හට තවත් ලකුණු 1 ක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

එසේම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් 22/2017 චක්‍රලේඛනයට පටහැනි ලෙස ක්‍රියාකිරීම සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය විසින් වයඹ පළාත් අධ්‍යාපන ලේකම් වෙත යොමු කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමේදී, එමගින්ද පැහැදිලිව පෙන්වා දී ඇත්තේ පළමු ආකෘතිපත්‍රය අහෝසිකර දෙවන වරට ඉදිරිපත් කර ඇති ආකෘතිපත්‍රය අනුව ලකුණු ලබාදීමට කටයුතු කිරීම සාධාරණ නොවන බවට නිරීක්ෂණය වන බවයි.

පළාත් අධ්‍යාපන ලේකම් විසින් ඉහත සඳහන් කළ පරිදි කරුණු සොයා බැලීමෙන් පසු 2018.01.08 දිනැතිව වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත යොමුගත අංක NWP/CM/ED02 දරණ ලිපිය මගින් වැඩිදුරටත් පෙන්වා දී ඇත්තේ වයඹ පළාතේ විවිධ කලාප තුල ප්‍රධාන පෙලේ පාසල් 10 කට වැඩි සංඛ්‍යාවක 2018 වර්ෂයේ ආදිශිෂ්‍ය ගණය යටතේ 1 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු ලබා දිම සඳහා භාවිතා කරඇති ආකෘතිපත්‍ර පරීක්ෂාවට භාජනය කිරීමේදි අධ්‍යාපන ජයග්‍රහන හා විෂය සමගාමී ජයග්‍රහන පොදු සම්මතයකට අනුව නිශ්චිත වී ඇති නමුත් මෙම

විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සකස්කර භාවිතා කර ඇති දෙවන ආකෘති පත්‍රය එකී සම්මතයට පටහැනිව සකස්කර ඇති බව නිරීක්ෂණය වන බවයි.

වයඹ පළාත් අධ්‍යාපන ලේකම්ගේ 2018.01.08 දිනැති ලිපියේ තවදුරටත් දක්වා ඇත්තේ කුරුණෑගල ශුද්ධවූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ මෙම ගැටළුව නිරාකරණය වන තෙක් ආදිශිෂ්‍ය ගණය යටතේ 1 වන වසරට ළමුන් ඇතුළත් කිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලෙස 2017.12.20 දිනැති ලිපියෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා ඇතත්, එම නියෝගය නොතකා අදාළ විද්‍යාලයේ ආදිශිෂ්‍ය ගණය යටතේ 2018 වර්ෂයේ 1 වන ශ්‍රේණියට සිසුන් තෝරාගත් ස්ථිර නාම ලේඛනය ප්‍රසිද්ධ කර එම දරුවන් පාසලට ඇතුළත්කර ගැනීමට කටයුතුකර තිබීමෙන් මෙම ගැටළුව තවදුරටත් සංකීර්ණ වී ඇති බවයි.

වයඹ පළාත් අධ්‍යාපන ලේකම් විසින් තවදුරටත් දන්වා ඇත්තේ ඔහුගේ අවසන් නිරීක්ෂණ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් දෙවන වරට නිකුත් කළ ආකෘතිපත්‍රයට අනුව ලකුණු ලබාදීමෙන් පැමිණිලිකරුවන්ට හා පොදුවේ එකී විද්‍යාලයට 2018 වර්ෂයේ 1 වන ශ්‍රේණියට ආදිශිෂ්‍ය ගණයේ ඉල්ලුම්කල අයදුම්කරුවන් වෙත සිදුවී ඇති දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසය.

තවද මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ අයව වයඹ පළාත් සභා පාසලක සිසුන් ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක හෝ අභියාචනා මණ්ඩලයක සභාපති හෝ සාමාජිකයෙකු ලෙස මින් ඉදිරියට පත් නොකළ යුතු බවද සඳහන් කර ඇත.

සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලි පාර්ශවයට සිදුවී ඇති අගතිය සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය විසින් අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා කිසිදු සාධාරණ පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විසඳුමක් ලබාදීමට අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය ක්‍රියාකාර නොමැති බව තහවුරු වේ.

වයඹ පළාත් අධ්‍යාපන ලේකම් වෙත පැවරී තිබෙන බලතල අනුව ඔහුගේ කරුණු සොයා බැලීමට අනුව පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුවී ඇති බව ඔහු විසින් පිළිගෙන ඇති නමුත් පැමිණිලි පාර්ශවයට සහන ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර චක්‍රලේඛනයට පටහැනිව කටයුතුකර ඇති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා සම්බන්ධයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය වේ.

වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නියෝගයක් අනුව වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිව් දෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් 2018.01.04 වන දින අදාළ විද්‍යාලයට ගොස් සිදුකරන ලද පරීක්ෂණයෙන් පසු ලබා දී ඇති වාර්තාව මඟින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ

සභාපතිවරයා නිර්දෝෂී බව පෙන්වා දී ඇති නමුත් අධ්‍යාපන ලේකම්වරයා පෙන්වා දී ඇති දෙවන ආකෘතිපත්‍රයක් භාවිතා කිරීම හේතුවෙන් පැමිණිලි පාර්ශවයට සිදුවී ඇති අගතිය පිළිබඳව කිසිදු සඳහනක් නොවීම මත පෙනීයන්නේ මෙම පරීක්ෂණ මණ්ඩලය සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සභාපතිවරයා ආරක්ෂා කිරීම සඳහා කටයුතු කර ඇති බවයි.

**නිගමනය -:**

කුරුණෑගල ශුද්ධ වූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය ගණය යටතේ 2018 වර්ෂයේ 1 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී 2 වන වරට ආකෘතිපත්‍රයක් ලබාදීම මඟින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 22/2017 උල්ලංඝනය කරමින් කටයුතු කිරීම හේතුවෙන් පැමිණිලි පාර්ශවයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති නීතිය ඉදිරියේ සමාන ලෙස රැකවරණය ලැබීමේ මූලික අයිතිය උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය -:**

01. වයඹ පළාත් අධ්‍යාපන ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ පළමු ආකෘතිපත්‍රය අනුව පැමිණිලි පාර්ශවය වෙත ලකුණු ලබා දී ඔවුන් විසින් ලබාගන්නා ලකුණු අනුව අදාළ පාසලේ ආදිශිෂ්‍ය ගණය යටතේ දරුවන් ඇතුලත්කර ගැනීමේ අවම ලකුණු සීමාවට පැමිණෙන අයදුම්කරුවන්ගේ දරුවන් පාසලට ඇතුලත් කිරීමට වයඹ පළාත් අධ්‍යාපන ලේකම්වරයා විසින් සහ අනෙකුත් වගඋත්තරකරුවන් විසින් කටයුතු කළ යුතුය.

02. අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කර ඇති වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන) පී.එම්. නසීර් මහතාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පියවර ගත යුතුය.

2019.07 . 29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු

නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත - 01 ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/R-6